(c) www.sinhalalyrics.com

දනන් රුහිරු බී පණ නළ හප කරන
කයින් භාගතේ තබවා උන් පෙලන
එවුන් මරු කටට නොයවන දෙවි වරණ
දෙවුන්දරින් යනු පුදපෙත් නොපිලිගෙන

සතර උගත් දරුකැළ ඇවිදිති බඩගා
විතර විකුම් පෙන්වයි කාසිය මුරගා
දුරැර හරිනු ඒ දොස් දැක නොකර නිගා
කතරගමින් පිටමන් වී යනු මුරුගා

නැගෙන්නට සදන අත් පෙල බිමට නැමූ
සිතන්නට තිබෙන සිත් වල අගුළු දැමූ
යකුන් නසනු බැරි නම් තට අපි නසමු
සමන් සුරිඳු යනු නොරැඳී සබරගමු

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ශෙල්ටන් ප්‍රේමරත්න